**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පොදු පරිපාලන හා සෞඛ්‍ය සේවා වැඩසටහන් යටතේ වැටුප් හා දීමනා සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි වෙන්කිරීම් පිළිවෙලින් රු.123,707 ක් සහ රු.44,284 ක්, ආදායම් හා වියදම් ගිණුමට රු.118,719 ක් සහ රු.42,166 ක් ලෙස සටහන් කිරීම නිසා රු.7,106 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) භෞතික සැළසුම්, මංමාවත් හා ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහන යටතේ වැය ශීර්ෂ 309 න් අඩුකළ යුතු රු.67,356 ක ඉතිරි තොග වැය ශීර්ෂ 303 න් අඩුකර තිබුණි.

(ඈ) දෙවන වැඩසටහන යටතේ බලපත්‍ර ආදායම් රු.222,300 ක්, රු.182,635 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ලැබිය යුතු මූලධන ආධාර රු.82,650 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ උත්සව අත්තිකාරම් රු.195,000 ක් සහ විශේෂ අත්තිකාරම් රු.80,000 ක් වැටුප් හා දීමනා ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඊ) ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ වරිපනම් බදු රු.2,945 ක් කලින් ලැබීම් ලෙස ගිණුම් ගත නොකර හිඟ හිටි වරිපනම් බදු ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි.

(උ) කර්මාන්ත ගබඩා තොග ශේෂය වූ රු.81,486 තුළ රු.14,130 ක් වූ ඉන්වෙන්ට්‍රි විෂයයන්හි වටිනාකම්ද ඇතුළත් කර තිබුණි.

## 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් ශේෂ 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.7,167,982 ක් වූ අතර, උපයෝගී ලේඛන හා උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.7,564,155 ක් විය.

## 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,526,715 ක් විය.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු නොමැතිවීම නිසා රු.603,439 ක් වූ ගිණුම් ශේෂයන්ද , රු.1,552,026 ක් වූ ගනුදෙනු ද විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(2)(ඇ) ඡේද | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාල කාර්යය නිමවූ වහාම නිරවුල් කළ යුතු වුවද, 2006 වර්ෂයේ සිට 2010 මාර්තු 09 දක්වා කාලය තුළ ගෙවා තිබූ රු.19,858 ක අත්තිකාරම් 2011 අප්‍රේල් වන විටත් පියවාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | එක් ජංගම ගිණුමකට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ක් ඉක්මවා ගෙවීමට ඉදිරිපත් නොකළ එකතුව රු.38,802 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 | සෑම වර්ෂයක් අවසානයෙම භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් 2007 දෙසැම්බර් 31 න් පසු භාණ්ඩ සමීක්ෂණයක් කළ බවට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1645(අ) | වාහන සම්බන්ධයෙන් වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1647(ඉ), මු.රෙ. II කාණ්ඩයේ උපලේඛන | යොමුගත රෙගුලාසි ප්‍රකාරව පවත්වාගෙන යායුතු වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2004 ජූලි 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක LG/05/2004 | පළාත් පාලන ආයතන සතු මුදල්, උපකරණ, ගබඩා යන සෑම වර්ගයකම දේපල භාරව සිටින සහ ආදායම් |

| | |
|---|---|
| දරන චක්‍රලේඛයේ 2 වන ඡේදය | එකතු කරන නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප මුදලක් අයකරගැනීම ලේකම්ගේ වගකීම වුවද සභාවේ ඉහත රාජකාරි ඉටුකරන කිසිදු නිලධාරියෙකුගෙන් ඇප මුදල් අයකර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,691,100 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,837,225 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 153, 160, 165 වගන්තිවලට අනුව මාසයකට රු.50,000 හෝ වසරකට රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදීගැනීම් වෙනුවෙන් ගෙවන මුදලින් 5% ක් රඳවාගෙන එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට ප්‍රේෂණය කළ යුතු වුවත් 2010 අප්‍රේල් හා මැයි මාසවල ගෙවීම්වලින් රඳවාගත යුතු රු.112,792 ක් රඳවාගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයයක හා වියදම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර 10% සිට 236% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයන් අනාවරණය වූ අතර, ආදායම් විෂයයන් 07 ක හා වියදම් විෂයයක 07% සිට 90% දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

2.3 **ආදායම් පරිපාලනය**

(අ) **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2010** | | | **2009** | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේ-න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේ-න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 1,101 | 1,078 | 24 | 867 | 768 | 99 |
| (ii) | බදු කුලී | 525 | 525 | -- | 405 | 405 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 147 | 147 | -- | 124 | 124 | -- |
| (iv) | වෙනත් ආදායම් | 1,890 | 1,890 | -- | 1,799 | 1,809 | (10) |

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දිනට රු.1,321 ක හිඟ බදුකුලී ශේෂයක් දැක්වුවද ඉහත තොරතුරු අනුව එදිනට හිඟ බදු කුලී ශේෂයක් නොතිබුණි.

## 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | **2010** | | | **2009** | | |
|---|---|---|---|---|---|---|
| <u>වියදම් විෂයය</u> | <u>අයවැයගත</u> | <u>තථ්‍ය</u> | <u>විචලනය</u> | <u>අයවැයගත</u> | <u>තථ්‍ය</u> | <u>විචලනය</u> |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 13,857 | 11,292 | 2,565 | 11,741 | 8,947 | 2,794 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් | 11,022 | 4,606 | 6,416 | 5,060 | 6,873 | (1,813) |
| උප එකතුව | 24,879 | 15,898 | 8,981 | 16,801 | 15,820 | 981 |
| ප්‍රාග්ධන වියදම | 19,252 | 30,701 | (11,449) | 39,090 | 2,356 | 36,734 |
| මුළු එකතුව | 44,131 | 46,599 | (2,468) | 55,891 | 18,176 | 37,715 |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 10 | 06 |
| ප්‍රාථමික | 42 | 40 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 04 |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 2,410,345 ක් විය.

### 2.6.2 සමීක්ෂණය නොකළ වත්කම්

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු. 24,935,494 ක් විය.

2.7 **අවිධිමත් ගනුදෙනු**

**නිල ඇඳුම් දීමනා ගෙවීම**

1997 අගෝස්තු 19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) අංක දෙ/මුල/2/9/97 දරන චක්‍රලේඛය අනුව නිල ඇඳුම් සඳහා මුදලින් ගෙවීම් නොකළ යුතුව තිබූ බවද , නිල ඇඳුම් ලබාදිය යුතු බවද අවධාරණය කර තිබියදී නිල ඇඳුම්ලාභීන් 32 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.16,075 ක් මුදලින් ගෙවා තිබුණි.

2.8 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2.8.1 **සභාව සතු මංමාවත්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21(2) වගන්තිය අනුව සභාව සතු මාර්ග ගැසට් කර ප්‍රකාශයට පත් කළ යුතු වුවත් 2008 වර්ෂයෙන් පසු සභාවට පවරාගෙන තිබූ හෝ සභාව සතු වූ මාර්ග 273 ක් ගැසට් කර ප්‍රකාශයට පත්කර නොතිබණි.

2.8.2 **තොග පාලනය**

(i) මාර්ග සංවර්ධන කටයුතු සඳහා මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි මිලදී ගෙන තිබූ හියුම් පයිප්ප, තාක්ෂණ නිලධාරී මගින් මන්ත්‍රීවරුන්ට නිකුත් කර තිබුණි. එසේ වුවද ඒවා සවිකර තිබූ ස්ථාන පිළිබඳ කිසිදු වාර්තාවක් නොතිබූ අතර 2010 වර්ෂයේදී මන්ත්‍රීවරු දෙදෙනෙකු විසින් ඉල්ලුම් කර සභාව විසින් මිලදී ගෙන තාක්ෂණ නිලධාරී මගින් එකී මන්ත්‍රීවරුන් දෙදෙනාට නිකුත් කර තිබූ රු.52,500 ක් වූ හියුම් පයිප්ප 10 ක් සවිකර තිබූ ස්ථාන විගණනයේදී අනාවරණය නොවීය.

(ii) විදුලි භාණ්ඩ හා උපකරණ මිලදීගැනීමේදී ගබඩා අවශ්‍යතාවයන් පිළිබඳ ගබඩා භාර නිලධාරීගේ ඉල්ලීම් නොමැතිව මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට විදුලිභාණ්ඩ මිලදීගෙන තිබුණි.

(iii) 2010 දෙසැම්බර් මාසයේ මිලදීගෙන තිබූ රු.297,455 ක් වූ විදුලි භාණ්ඩ, සභාපතිවරයාට සහ මන්ත්‍රීවරුන් තිදෙනෙකුට තාක්ෂණ නිලධාරි මගින් නිකුත් කර තිබූ අතර, ඒවා සවිකර තිබූ ස්ථාන පිළිබඳ වාර්තා නොතිබුණි. එක් දිනකට සවිකරනු ලබන ප්‍රමාණය මත නිකුත් නොකර වරකට මිලදීගෙන තිබූ භාණ්ඩ තොගයම (බොහෝ විට වරකට රු.50,000 ක පමණ මිලදීගැනීම්) තාක්ෂණ නිලධාරි වෙත එකවර නිකුත් කර තිබුණි.

(iv) විදුලි භාණ්ඩ අළුතින් සවිකිරීමේදී ගබඩාවට භාරද තිබූ ගලවා ඉවත් කරන ලද භාණ්ඩ පිළිබඳ වාර්තා නොතිබුණි.

(v) සභා බල ප්‍රදේශයේ විදුලි කණු අංක කර නොතිබුණි.

(vi) 2010 ඔක්තෝබර් 29 දින ද්‍රව්‍ය ඇණවුම් අංක 295 මගින් ඇණවුම් කර තිබූ රු.6,000 ක් වටිනා සාමාන්‍ය ස්විච් 75 ක් 2010 නොවැම්බර් 09 දින නිකුත් නියෝග අංක 001222 මගින් තාක්ෂණ නිලධාරි වෙත නිකුත් කර තිබුණද එම තොගය තොග ලේඛනයේ සටහන් කර නොතිබුණි.

### 2.8.3 ඉඩම් පවරාගැනීම්

2006 වර්ෂයේදී වෙන්දේසි කර තිබූ අක්කර 3, රූඩ් 1, පර්චස් 21 ක් වූ බෙල්ලන දියන්තගොඩලන්ද ඉඩමෙන් පොදු පහසුකම් සඳහා වෙන් කර තිබූ පර්චස් 51 ක ඉඩම් කැබැල්ල විගණන දිනය වූ 2011 ජනවාරි 26 දින වන විටත් සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.9 කොන්ත්‍රාත් පරිපාලනය

### 2.9.1 පොල භූමියේ කඩ කාමර ඉදිකිරීම - දෙවන ව්‍යාපෘතියේ I අදියර

2009 වර්ෂයේ ඉහත ව්‍යාපෘතිය සඳහා රු.11,000,000 ක ඇස්තමේන්තුවක් මත රු.9,675,300 ක ගිවිසුම් ගත වටිනාකමක් යටතේ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 ජනවාරි 28 දින ව්‍යාපෘතය වෙනුවෙන් පවත්වා තිබූ ව්‍යාපෘති ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව සඳහා සිවිල් ඉංජිනේරුවරයා සහ දිස්ත්‍රික් ඉංජිනේරුවරයා සහභාගි වී නොතිබුණි

(ii) තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහාද ඉංජිනේරුවරයා සහභාගි වී නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ -2006 හි 5.4.4 වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකදී කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු අත්තිකාරම් මුදල වියදම් ඇස්තමේන්තුවෙන් 20% ක් විය යුතු වුවත් මෙම කොන්ත්‍රාත්කරුට 25% ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබීමෙන් රු.483,765 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) කඩ කාමර ඉදකිර්මට අදාල ඇස්තමේන්තුව හා සැළැස්ම පිළියෙල කිරීම සඳහා පුද්ගලික වරලත් ඉංජිනේරුවරයෙකු වෙත රු.60,000 ක් ගෙවා තිබුණද , ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(v) ඉදිකිරීමට අදාල සැළැස්ම සහ ඇස්තමේන්තුවෙහි මිණුම්පතක් විගණනයට ඉදිරිපත් නොකෙරිණ.

(vi) සියළුම කඩ කාමර සඳහා උසස් වර්ගයේ ඇළුමිනියම් දොරවල් සවි කර තීන්ත ආලේප කිරීම සඳහා ගිවිසුම් ගත ඇස්තමේන්තුවෙහි වැඩ විෂය අංක 24 යටතේ වර්ග අඩි 1,560 ක් සඳහා රු.1,560,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. අවසන් ගෙවීමට අදාල මිණුම් පත්‍ර අනුව ඒ සඳහා වර්ග අඩි 1791.75 කට රු.1,791,150 ක් ගෙවා තිබීමෙන් ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රු.231,150 ක් ගෙවා තිබුණි. එසේ ගෙවා තිබියදී දොරවල් සවිකිරීමේදී ඇතිවූ හිදැස සඳහා අමානෝ තහඩු මිලදී ගැනීම ලෙස සඳහන් කරමින් අමතර වැඩ ලෙස රු.35,910 ක අතිරේක ගෙවීමක් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රු.267,060 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(vii) 2011 ජනවාරි 26 දින කඩ කාමර සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී එහි බිත්ති පිටතින් ඉරිතලා ගොස් තිබූ අතර පඩිපේලිය ලඟ බිත්තියෙහි විශාල ඉරිතැලීමක්ද අංක 3, 4, 5 කඩකාමරවල බිත්ති ඇතුළතින්ද ඉරිතලා ගොස් තිබුණි.

(viii) කඩ කාමරවල පෙර ගෙවුම් මුදල හා බදුමුදල තීරණය කිරීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබාගත් තක්සේරු වාර්තාවක් නොතිබුණි.

(ix) ඉදිකර තිබූ කඩකාමර 14 න් 03 ක් 2011 ජනවාරි වන විටත් කුලියට ලබාදී නොතිබුණි. සියළුම කඩකාමර කුලියට දීම තුළින් ලබාගැනීමට අපේක්ෂිත පෙරගෙවුම් මුදල රු.11,550,000 ක් වුවද ලැබී තිබූ මුදල රු.9,075,000 ක් විය.

### 2.9.2 මාර්ග සංවර්ධනය කිරීම

(i) මීටර් 81.9 ක් දිග කළුගල, මගුර කනත්ත පාර, මීටර් 54 ක් දිග මගුර පුවක්ගහදෙනිය පාර හා මීටර් 37 ක් දිග ලත්පඳුර, කුරුදුවත්ත පාර කොන්ක්‍රීට් කිරීමේදී එම මාර්ග ප්‍රසාරණ මූට්ටු දැමීමකින් තොරව කොන්ක්‍රීට් කර තිබූ බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ii) කළුගල, මගුර කනත්ත පාර ආරම්භයේ සිට මීටර් 45 දීද, මගුර, පුවක්ගහදෙනිය පාර ආරම්භයේ සිට මීටර් 47 දීද, ලත්පඳුර කුරුදුවත්ත පාර ආරම්භයෙ සිට මීටර් 26.8 දීද හරස් අතට පැලීම් නිරීක්ෂණය විය.

### 2.10 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133, 134 හා 2008 අගෝස්තු 19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක WP/LGD/10/2008 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය

(ඇ) තොග පාලනය